දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2022 (ii)

මගේ අංකය: DAPH/AD/16/02/06
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණියේ දී ය.
2024.02.01

සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් මඟින්,
සියලුම කොට්ඨාස හාර පශු වෛද්‍යවරුන්

සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම.

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2022.02.22 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2022 හා 2022.05.27 දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2022 (i) ට වැඩිමනත් වශයෙනි.

01. 2022/ 2023 වර්ෂ සඳහා සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම

i. 2022 හා 2023 වර්ෂයන්ට අදාල නව සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම 2024.01.31 දිනෙන් අවසන් කලයුතුය. ඒ අනුව එම වර්ෂ වලට අදාල මාර්ගගත දත්ත පද්ධතිය 2024.01.31 දින මධ්‍යම රාත්‍රියෙන් අවසන් කරනු ලැබේ.

ii. එම දිනය වන විට ලියාපදිංචිය අලුත් කර ඇති සමස්ත සත්ත්ව ගොවිපොළ සංඛ්‍යාව 2023 වර්ෂයේ ක්‍රියාකාරී සත්ත්ව ගොවිපොළ සංඛ්‍යාව වශයෙන් සැලකිය යුතුය.

02. 2024 වර්ෂය සඳහා සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම

i. 2024 වර්ෂය සඳහා සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය හා සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය අලුත් කිරීම 2024.02.01 දින සිට ආරම්භ කලයුතුය.

ii. ඒ සඳහා වන නව සංශෝධිත මාර්ගගත දත්ත පද්ධතිය 2024.02.01 දින සිට හඳුන්වාදෙනු ලැබේ.

iii. 2024 වර්ෂය සඳහා සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය අලුත් කිරීම 2024.04.30 දිනෙන් අවසන් කලයුතු අතර නව ගොවිපොළ ලියාපදිංචි කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

03. පශු වෛද්‍ය කාර්යාල වලින් සිදුකරනු ලබන සියලු සේවාවන් ලියාපදිංචි සත්ත්ව ගොවිපොළ සඳහා පමණක් ඉදිරියේදී ඉටුකිරීමට තීරණය කර ඇත. එබැවින් ඔබගේ සේවා සැපයීමේදී ලියාපදිංචි කර නොමැති සෑම ගොවිපළක්ම ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන්ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :
01. ලේකම්, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
02. අතිරේක ලේකම් (පශු සම්පත් සංවර්ධන) - කාරුණික දැන ගැනීමට හා උක්ත කරුණ සම්බන්ධයෙන් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන දැනුවත් කිරීම සඳහා
03. ප්‍රධාන ලේකම් (බස්නාහිර/දකුණ/මධ්‍යම/ සබරගමුව/ඌව/වයඹ/උතුරු මැද/උතුර/නැගෙනහිර) - කාරුණික සහාය ලබා දීම සඳහා
04. ලේකම්, පළාත් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - කාරුණික සහාය ලබා දීම සඳහා
05. දිස්ත්‍රික් ලේකම්වරුන් - කාරුණික සහාය ලබා දීම සඳහා
06. සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කාරුණික අ.ක.ස

07. සියලුම අධ්‍යක්ෂවරුන් /ලේඛකාධිකාරී (පශු ඖෂධ /සත්ත්ව ආහාර)- කාරුණික අ.ක.ස
08. ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන අභ්‍යන්තර විගණක / ඉංජිනේරු - කාරුණික අ.ක.ස
09. විශේෂඥවරුන් / ප්‍රධාන විද්‍යාඥවරුන් - කාරුණික අ.ක.ස
10. ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී / පශු විමර්ශන නිලධාරීන් - කාරුණික අ.ක.ස
11. අංශ ප්‍රධානී (ව්‍ය.සං.ආ.ප්‍ර. ඒකකය) - කාරුණික අ.ක.ස